# <u>පුරවැසි ප්‍රඥප්තිය</u>

## ආයතනයේ නම : ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය

"ඔබ දැන් ප්‍රවේශ වන්නේ ඔබට සේවය කිරීමට සූදානම්ව සිටින ස්ථානයකටයි."

## අපගේ දැක්ම :

ශ්‍රී ලංකා ජනරජයේ උත්තරීතර අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය මගින් සිදු කරනු ලබන යුක්තිය පසිඳලීම සඳහා වූ කාර්යාල කටයුතු නිවැරදිව හා කාර්යක්ෂමව සිදු කිරීම.

## අපගේ මෙහෙවර :

ශ්‍රේෂ්ඨාධිකරණය, ශ්‍රී ලංකා ජනරජයේ අවසානාත්මක ලේඛනෝපගත කිරීමේ අධිකරණය වන බැවින්, නීතිය හා සබැඳි ගැටලු නිරාකරණය කිරීම මගින්, එම උත්තරීතර ආයතනයට අනන්‍ය වූ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද, යුක්තිය පසිඳලීමේ අභිලාෂයන් මුදුන්පත් කර ගැනීමට ද, අවශ්‍ය සියලු කාර්යාල කටයුතු කඩිනම්ව හා කාර්යක්ෂමව නොපිරිහෙලා සිදු කර, ශ්‍රේෂ්ඨාධිකරණ කාර්යාලය වෙත පැමිණෙන සියලු පාර්ශවයන් තෘප්තිමත් වන අයුරින් සේවය ලබා දීම.

## අපගේ කැපවීම :

- අවංකව
- ප්‍රඥාවන්තව
- ආචාර සම්පන්නව
- අවබෝධයෙන් යුක්තව
- විෂය මූලිකව හා අපක්ෂපාතීව
- විනිවිද භාවයෙන් යුක්තව
- වගවීමෙන්
- අප්‍රමාදව
- කාර්යක්ෂමව හා සඵලතාවයෙන්

ලබාදීමට කැපවී සිටින්නෙමු.

## අපගේ බැඳීම

| | ලබාදෙන සේවය | සේවය ලබාදීමේ ප්‍රමිති (පැය/සති/දින) | අදාළ නීති, සංග්‍රහ,රෙගුලාසි ආදිය | ඉදිරිපත් කළයුතු තොරතුරු ලේඛන | ඔබට උදව් ලබාගත හැක්කේ |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ හැකි සියලු නඩු භාර ගැනීම, නඩු ගොනු පිළියෙළ කිරීම හා එකී ගොනු ආරක්ෂිතව තබා ගැනීම. | | *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත, 2006 අංක 54 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත, 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත ආදී පනත්.<br>*සිවිල් නඩු විධාන සංග්‍රහය<br>*ශ්‍රේෂ්ඨාධිකරණ රීති<br>*අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ<br>*තොරතුරු දැනගැනීමේ පනත<br>*ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ | | නි.රෙජිස්ට්‍රාර්, (උසාවි අංශය) , ශ්‍රේෂ්ඨාධිකරණය |
| 02 | විවෘත අධිකරණයේ ඇසෙන නඩු ලැයිස්තුව පිළියෙළ කිරීම සහ ඉල්ලීම් දින ගත කිරීම. | | *ශ්‍රේෂ්ඨාධිකරණ රීති<br>*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | | රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණය |
| 03 | අධිකරණ නියෝගයන්ට සහ නඩු තීන්දුවලට සහතික පිටපත් ලබා දීම. | නියෝග,තීන්දු ප්‍රකාශයට පත් කළ දින සිට සති දෙකක් තුළ | *ශ්‍රේෂ්ඨාධිකරණ රීති<br>*අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ<br>*තොරතුරු දැනගැනීමේ පනත | මෝසම | නි.රෙජිස්ට්‍රාර්, (උසාවි අංශය) , ශ්‍රේෂ්ඨාධිකරණය |
| 04 | ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් බඳවා ගැනීම. | සියලු ලේඛන අදාළ අපේක්ෂකයන් භාර දුන් පසු එදින සිට මාස දෙකක් තුළ | *ශ්‍රේෂ්ඨාධිකරණ රීති<br>*අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ<br>*තොරතුරු දැනගැනීමේ පනත | * නීති විද්‍යාලයෙන් ලබාදෙන පෝර්මය<br>* දිවුරුම් ප්‍රකාශය<br>* නීති විද්‍යාලයෙන් ලබාදුන් සහතික<br>* නම ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රය<br>* පුවත්පත් නිවේදනය<br>* ආධුනික පුහුණු කාලය අවසන් කිරීමේ ලිපිය.<br>* බඳවා ගැනීමේ නිවේදනය<br>* චරිත සහතික (2) | රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | දිවුරුම් පෙත්සම් හා වෙනත් ලේඛනවල අත්සන් තබා ඇති නීතිඥවරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ලියාපදිංචිව ඇති ද යන්න තහවුරු කිරීම. | දිනක් ඇතුළත | | අදාළ ලේඛන ශ්‍රේෂ්ඨාධිකරණ කාර්යාලයේ දිවුරුම් පෙත්සම් සහතික කරන නිලධාරියා වෙත භාර දිය යුතුය. | නි.රෙජිස්ට්‍රාර්, (උසාවි අංශය) , ශ්‍රේෂ්ඨාධිකරණය |
| 06 | නීතිඥවරුන්ට එරෙහිව විනය සම්බන්ධ මූලික කටයුතු කිරීම. | | *අධිකරණ සංවිධාන පනත- 43 සහ 44 වගන්ති<br>*ශ්‍රේෂ්ඨාධිකරණ රීති | දිවුරුම් ප්‍රකාශ සමඟ අදාළ ලේඛන | නි.රෙජිස්ට්‍රාර්, (පාලන අංශය) , ශ්‍රේෂ්ඨාධිකරණය |
| 07 | ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වී ඇති සියලුම නඩු සම්බන්ධ යාවත්කාලීන වූ තොරතුරු ලබාගැනීම සඳහා නඩු ගොනු පරිශීලනය කිරීමේ අවස්ථාව ලබාදීම. | දින 1-4 අතර | | | නි.රෙජිස්ට්‍රාර්, (උසාවි අංශය) , ශ්‍රේෂ්ඨාධිකරණය |

## **<u>අපගේ අපේක්ෂාව</u>**

අප ආයතනය කෙරෙහි ඔබ තබා ඇති විශ්වාසය ගැන ඔබට ස්තූති කරන අතර, අපගේ සේවය සඳහා ඔබ විසින් කරනු ලබන ඉල්ලීම්, යුක්ති සහගත සාධාරණ සහ නියමිත කලට ඉදිරිපත් කිරීමෙන් ද, අංග සම්පූර්ණ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ද, අපගෙන් අපේක්ෂා කළහැකි සහ අපේක්ෂා කළ නොහැකි දේ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ඔබ වෙත තිබීම මගින් ද, අප වෙත සහයෝගය පළ කිරීමට ඔබට හැකි බව දන්වනු කැමැත්තෙමු.

## **<u>අපගේ ප්‍රමිතීන්</u>**

ඔබේ ඉල්ලීම සමග ඉල්ලා ඇති තොරතුරු, ලිඛිත ලියකියවිලි සහ ගාස්තු ඉදිරිපත් කර ඇත්තේ නම්, ඔබ ඉල්ලා ඇති සේවය අප විසින් දැනුම් දී ඇති කාල පරාසය තුළ ඔබට ලබාදීමට අපි බැඳී සිටින්නෙමු.

අවසාන තීරණය ගැනීම ප්‍රමාද විය හැකි හෝ අනිවාර්යයෙන්ම ප්‍රමාද වන අවස්ථාවකදී හෝ ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වූ විටක එයට හේතුව අප විසින් දන්වනු ලැබේ.

## පැමිණිලි සහ සහන ලබාදීමේ ක්‍රමවේදය

අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආචාර සම්පන්නව, අවශ්‍ය උපකාරය හා සේවාවන් ඔබට ලබා දෙනු ලැබේ. ඉහත සඳහන් ප්‍රමිතීන් හා සම්බන්ධ ඔබට ඇති පැමිණිලි පහත සඳහන් නිලධාරීන් වෙත යොමු කරන්න.

නම - අරවින්ද ගුණරත්න මහතා

තනතුර - රෙජිස්ට්‍රාර්

පිහිටි ස්ථානය - ශ්‍රේෂ්ඨාධිකරණය

දුරකථනය/ෆැක්ස්/ඊ-මේල්- 0112435446

නම - ක්‍රිෂාණි කෝදාගොඩ මිය

තනතුර - නි. රෙජිස්ට්‍රාර් (උසාවි අංශය)

පිහිටි ස්ථානය - ශ්‍රේෂ්ඨාධිකරණය

දුරකථනය/ෆැක්ස්/ඊ-මේල්- 0112436958

සේවාලාභී මහජන ඔබෙන් ඉදිරිපත් වන යෝජනා අපි සතුටින් භාර ගනිමු.

අ. අපගේ සේවාවන් ලබන ඔබ හෝ ඔබේ නියෝජිතයින් අප සමග සම්බන්ධ වීමට අපේක්ෂා කරන්නේ නම් කරුණාකර 0112 437 507 දුරකථන අංකයෙන් අමතන්න.

ආ. මෙම ප්‍රඥප්තියට ඇතුලත් කර ඇති කරුණු පිළිබද ඔබේ උපදෙස් ලබා ගැනීමට හෝ ඔබේ අදහස් ලබාදීමට ඔබ දක්වන කැමැත්ත ඇතුළත් කර ඔබගේ විස්තර scdreg@sltnet.lk ඊමේල් ලිපිනය හරහා දැනුම් දෙන්න.

පුරවැසි ප්‍රඥප්තිය, අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ඔබත් අපත් එක්ව දරන ඒකාබද්ධ ප්‍රයත්නයකි. ලබාදෙන සේවය තවත් වැඩි දියුණු කිරීමට ඔබගේ අදහස් ලබාදීමෙන් අපට උපකාරී වන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

ප්‍රඥප්තිය යටතේ ලබාදෙන සේවාවන් නිරතුරුව සංශෝධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට අපි කටයුතු කරමු.